**යුද්ධය නවත්වව්!, බඩු මිල බස්සව්!, ගෝලීය බලවතුන්ට රට විකිණීම නවත්වව්!**

එක පාරටම සෞඛ්‍ය අමාත්‍යාංශය කලබල වෙලා, ඒ ඇත්තෝ දමපු වෘත්තීය සමිති තහංචිය ඉවත් කරගත්ත. චක්‍රලේඛය ගෙනාවේ නම් සමිතිවල කොඳු නාරටිය කඩල වැඩවර්ජන උද්ඝෝෂණ නවත්වන්න ඕන කියලයි.

**වෘත්තීය සමිති හා බලය බෙදීමේ යෝජනා**

මේක තමා දැන් ටික කලක ඉඳන් නිමල් සිරිපාල ඇමතිතුමාගේ කටේ රැව් දෙමින් තියෙන්නේ. උන්නැහේට රෑ දවල් නැතිව හීන පෙනෙන්නේ සමිතිකාරයින්ව මට්ටු කිරීම ගැන.

හැබැයි දොස්තරවරුන්ගේ වැඩවර්ජනයේ ඉඳලා පෝලිමට වැඩ හම්බ වෙයි කියලා පෙනෙන කොට වැඩේ දිග්ගැස්සෙන්න ඉස්සෙල්ලා නවත්ත ගන්නට හිතුවා වෙන්න ඕනෑ.

නිමල් සිරිපාල උන්නැහේගේ මේ සමිති විරෝධය ඒ උන්දැගේම පුද්ගලික ප්‍රතිපත්තියක් වෙන්න බෑ. ඒක ඊට වඩා දුරදිග ගිය වැඩක් ඉහළින්ම පටන් ගත්ත. නමුත් දැන් ඉදිරි කාලයේදී ආණ්ඩුවට සමිති එක්ක හැප්පෙන්න නෙවෙයි වෙන්නේ.

ජනාධිපතිතුමා බැරි වෙලාවත් බලය බෙදීමේ යෝජනා අරගෙන එළියට දැම්මොත් රට වනසන්න බලාගෙන ඉන්නේ ජනතා විමුක්ති පෙරමුණයි. ඔවුන් බලාපොරොත්තු වෙන්නේ යුධ මෙහෙයුම තුළින්ම තමාගේ අතට බලය ගන්න.

ඒකට අඩිය තිබ්බොත් ආණ්ඩුවට වෘත්තීය සමිති ගන්න පියවර ඉතාමත් ප්‍රධාන වෙනවා. ඒකත් දැනිලද දන්නේ නෑ දැන් සමිති විරෝධය නිවා ගන්නට වැඩ පෙන්වන්න හදන්නේ.

අනෙක් අතට වැටුප් වැඩිකිරීම ගැනත් බොරු ප්‍රචාර හරි කෙරෙන බව පෙනෙනවා. ජීවන අංක ගෙවීම් ගැන අලුතින් පරණ කථාවම පටන් අරන් තියෙන්නේ මේ ගැන සමිති මොකද කියන්නේ කියලා බලන්නයි.

මොන මොනවා හරි කැරට් අල පෙන්නලා ආර්ථික සටන් ඇති වෙන එක නවත්ත ගන්නට උන්නැහේලා දඟලනවා වෙන්න ඕනෑ. ජනතා විමුක්ති පෙරමුණ බලා ඉන්නේ මේ බඩගිනි සටන පවා කෙළින්ම තමාගේ දේශප්‍රේමී සටනේ ඉත්තෙක් කරගන්න. ඒක පංති සටන් ක්ෂේත්‍රයට ගලා යන්න ඉඩ නොදී දේශප්‍රේමී මඩ ගොඩට ඇදගෙන යන්න තමයි දැන් විමල්ලා සෙට් වෙගන එන්නේ.

මහින්දගේ 13 වන ව්‍යවස්ථා සංශෝධන කථා හා ඉංදියාවේ මැදිහත්වීම් ගැන වර්ණනා දැන් විමල්ලට ලොකු සිහින මවන්න හේතු වෙලා. අර වල් ඌරන් කැකුණ තැළුවහම හබන් කුකුළන්ට මගුල් කිව්වා වගේ, මහින්ද බලය බෙදීම ගැන කියන්න, කියන්න විමල්ලට රජ මගුල් උදාවෙන පාටයි.

ඒත් ජනතාවගේ සමාජ අරගලය දිගටම නිහඬවම තිබෙන එකක් නෑ. සමිති නායකයින් සටන් මහට යන්නට තවම අදහසක් ඇති කර ගත්තෙ නැති වුණත් වෙනත් පැතිවලින් බලපෑම වැඩි වෙලා බව පෙනෙනවා.

මේ ලබන 26 වැනිදාට "යුද්ධය එපා!, බඩුමිල අඩු කරව්!, දේශීය සම්පත් ගෝලීය ධනවාදී විනාශයට බිලි නොදෙව්!" ආදී සටන්පාඨ සමඟ කෙරෙන උද්ඝෝෂණයක් ලෑස්ති කරල තියෙනව කියලා කථාවක් යනවා.

ඒක රාජ්‍ය නොවන සංවිධාන කිහිපයක වැඩක් වුණත් එයින් සිග්නල් එකක් වැටෙනව සමිති ව්‍යාපාරයටත්. 26 වැටෙන්නේ සෙනසුරාදාට නිසා එය වැඩ කරන ජනතාවගේ ක්‍රියාකාරී දිනයක් වෙන්නේ නැහැ. සාමාන්‍ය සාම සමාජයේ වැඩක් හැටියටයි ක්‍රියාත්මක වෙනවා ඇත්තේ.

රජයට බලපෑමක් කොහොම වුණත් නිදාගෙන ඉන්න සමිති නායකයින්ට නම් යම් පණිවිඩයක් යන්නට පුළුවන්. වෙන වමේ සංවිධාන කොහොම වුණත් වාමාංශික පෙරමුණ නම් මේ වෙලාවේ "යුද්ධය නවත්වව්!, බඩු මිල බස්සව්!, ගෝලීය බලවතුන්ට රට විකිණීම නවත්වව්!" කියන සටන් පාඨ උඩ ජනතාව පෙළ ගස්සනවට කැමැතියි.

මං හිතන්නේ අනෙක් සභාගවාදී නොවන වාමාංශික සංවිධාන වුණත් මේ වගේ උද්ඝෝෂණයන් සඳහා එකතු වෙන්න පුළුවන්. හුහක් සමිති සමාගම් වුණත් ඉදිරියට එන්න පුළුවන් මේ සටන්පාඨ උඩ. ඒ වගේ රැල්ලක් සමඟ 31 වන බ්‍රහස්පතින්දා විරෝධතාවයක් ඇති කිරීමට බලාපොරොත්තුවක් වමේ උදවියට තියෙනව.

**ජවිපෙ මුදලාලිලා ගේ ජාතිවාදයද, පීඩිතයන්ගේ සමාජවාදයද?**

විශේෂයෙන් ජනතා විමුක්ති පෙරමුණ යුද්ධය වෙනුවෙන් ජනතාව පෙළ ගස්සන්නට ලොකු සැලැස්මක් දමන මොහොතේ ඒකට ප්‍රතිපක්ෂව ජනතාව යුද්ධයේ බර, උද්ධමනයේ බර හා ගෝලීය ධනපති සැලැසුම්වල විනාශයේ බර ගැන අවදි කරල පෙළ ගැස්මකට ගෙන්නන එක වැදගත්.

කොහොම වුණත් 2008 වසර ආරම්භයේ ඉඳලම රට තුළ සමාජවාදයද, ජාතිවාදයද කියන මූලික පිල් බෙදීමකට ජනතාව දෙපැත්තකට බෙදෙන ලක්ෂණ මතු වෙලා තියෙනව. දැන් ජනතා විමුක්ති පෙරමුණ සමාජවාදය ගැන කථාව නවත්වලා ඊනියා දේශප්‍රේමය ගැන පමණක් කථා කරන්නට පටන් අරන්.

ඒත් ජනතාවට විශාල සමාජ බරක් උසුලන්න වෙලා තියෙන්නේ ඉහළ සමාජය ඉතාම නින්දිත විදියට මගුල් කන අතරෙයි. ආහාර බිල ඉහළ යනකොට ගොවියාට වාසි වෙනවා වෙනුවට සිදු වෙලා තියෙන්නේ අතරමැදි ජාවාරම්කාරයෝ කෝටිපතියන් වෙන එකයි.

මේ දේශීය ධනපති මුදලාලි පැලැන්තිය බොරු දේශප්‍රේමය පෙන්නගෙන කරන්නේ රට විකුණගෙන කන එකයි. රට බේරගන්න යුද්ධ කරන බව කිව්වට යුද්ධය දැන් ලොකුම ජාවාරමක් වෙලා.

ඒ වගේම යුද්ධයට මුවා වෙලා ආහාර වෙළඳාමත් ලොකුම ගැරිල්ලක් වෙලා. ඒ නිසා අද ජනතාවට තීන්දු ගන්න වෙන්නේ මේ ජාවාරම්කාර මුදලාලිලාද අපිද කියන එකයි. සිවිල් ගැටුම මතු වෙන්නේ ඒ විදියටයි.